# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## කර්මාන්ත අමාත්‍යාංශය

# ඇබෑර්තු

1969 අංක 36 දරන පනතින් පිහිටුවන ලද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ වගකීම් පවරන ලද රාජ්‍ය අංශයේ ප්‍රමුඛ පෙළේ සංවිධානයකි.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ - මුදල් තනතුර (HM 1-2) (තනතුරු 01 යි)

### රැකියාවේ විස්තරය

* මණ්ඩලයේ මූල්‍යමය හා සේවා සැපයුම් කාර්යයන් භාරව කටයුතු කිරීම.
* නිසි අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
* මණ්ඩලයේ අයවැය හා වාර්ෂික මූල්‍යමය සැලැසුම් පිළියෙල කිරීම සහ අයවැය අධීක්ෂණය කිරීම.
* සියලුම ගනුදෙනු වල නිසි වාර්තා සටහන් පවත්වා ගැනීම සහ කාලීන කළමනාකරණ තොරතුරු ලබාදීම සහ මණ්ඩලයේ අවසන් ගිණුම් හා අතුරු ගිණුම් පිළියෙල කිරීම.
* මණ්ඩලයේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපතිවරයාගේ විමසීම් වලට පිළිතුරු සැපයීම සහ 13-7A සහ 14-2C වගන්ති යටතේ කෝප් COPE කමිටුව වෙත ඉදිරිපත් කිරීමට පෙර විගණකාධිපති වාර්තාවට පිළිතුරු සකස් කිරීම.
* මණ්ඩලය විසින් කලින් කලට පවරනු ලබන වෙනයම් රාජකාරී හෝ කාර්යයන්.
* අවශ්‍ය වන විටදී හා පරිදි මූල්‍යමය කරුණු පිළිබඳව සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මග පෙන්වීම.

### අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් :

**01.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/ මුදල්/ ව්‍යාපාර කළමනාකරණය/ වාණිජ්‍යය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය හෝ ගණකාධිකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (HNDA) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මාස්ටර්ස් (Master) උපාධිය

හෝ

**02.** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL)/ කළමනාකරණ ගණකාධිකාරවරුන්ගේ වරලත් ආයතනයේ UK(CIMA)/ වරලත් හා ආයතනික ගණකාධිකාරවරුන්ගේ සංගම (ACCA) පූර්ණ සාමාජිකත්වය

සහ

සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාල ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද

**03. පහසුකම් හා වරප්‍රසාද**

* ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම
* සේවකයා හා පවුල ආවරණය කරමින් වෛද්‍ය වියදම් සඳහා මුදල් ලබාදීම.
* HM ප්‍රභේදය සඳහා රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/1/2015 ප්‍රකාරව ප්‍රවාහන පහසුකම් හෝ දීමනා,
* වාර්ෂික පාරිතෝෂික
* පහසු පොලී අනුපාතයන් මත ආපදා ණය
* අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය

**04. පොදු කොන්දේසි**

01. මෙය සේවක මණ්ඩලයේ ස්ථිර තනතුරකි

02. තනතුරට තෝරාගනු ලබන අයදුම්කරු, සේවකයා විසින් 10% ක් හා මණ්ඩල විසින් 12% ක් ගෙවන සේවක අර්ථසාධක අරමුදලට (EPF) හිමිකම් ලබයි. මීට අමතරව සේවක භාරකාර අරමුදලට (ETF) මණ්ඩලය 3% ක දායකත්වයක් ලබාදේ.

03. අයදුම්පත් සමග උප්පැන්න අධ්‍යාපන වෘත්තීය, පළපුරුද්ද හා වෙනත් අදල සහතික වල පිටපත් ඉදිරිපත් කළ යුතුය. ඔබේ ජීව දත්ත සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකු පිළිබඳ විස්තර ඇතුලත් අයදුම්පත් 2021 ජනවාරි 25 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

04. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සේවකයින්ගේ අයදුම්පත් අදල ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

05. වයස් සීමාව : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

06. ඉහත සඳහන් සියලුම අවශ්‍යතාවයන් හා සමග අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

07. කුමන ආකාරයකින් හෝ පෙළඹවීම් කිරීම නුසුදුසුකමක් ලෙස සැලකෙනු ඇත.

**සභාපති,**
**කාර්මික සංවර්ධන මණ්ඩලය,**
**615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.**